# සංක්ෂිප්තය

මෙරට ගොවීන් කෘෂිකර්මාන්තය සඳහා ඉහළ අස්වැන්නක් ගෙන දෙන බීජ වර්ග භාවිතයට පෙළඹීමත් සමඟ ඉන් උපරිම ඵල නෙළා ගැනීමට දිරිදෙන රසායනික පොහොර හා කෘමිනාශක භාවිතයට ද පෙළඹිණි. එසේ වුව ද, කාලයත් සමඟ මෙම රසායනික පොහොර භාවිතයෙන් වගා කළ බෝගවල අස්වැන්න ආහාරයට ගැනීමෙන් විවිධ රෝග හට ගන්නා බව සොයා ගැනීමත් සමගම කාබනික පොහොර භාවිතය කෙරෙහි වැඩි අවධානයක් යොමු වන්නට විය. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ "කාබනික පොහොර නිෂ්පාදකයින් හා භාවිතා කරන්නන් මුහුණපාන ගැටලු සොයා බැලීම වන අතර ඒ යටතේ ක්ෂේත්‍රය තුළ කාබනික පොහොර භාවිතය පිළිබඳව නිෂ්පාදකයින් මෙන් ම පාරිභෝගිකයින් කොතෙක් දුරට දැනුවත් වී තිබේ ද? කාබනික පොහොර භාවිතය නිසා රසායනික පොහොර භාවිතය අඩු වී තිබේ ද? එසේ ම, කාබනික පොහොර නිෂ්පාදන ප්‍රමිතීන් මොනවා ද යන්න පිළිබඳ ව ගැඹුරින් අධ්‍යයනය කෙරේ.

ක්ෂේත්‍ර සමීක්ෂණයක් ආශ්‍රයෙන් සිදු කළ මෙම අධ්‍යයනය සඳහා කාබනික පොහොර භාවිතා කරන්නන්ගෙන් ද කාබනික පොහොර නිෂ්පාදනය කර අලෙවි කරන පිරිසගෙන් ද ප්‍රාදේශීය සභා, නගර සභා ආශ්‍රිත මධ්‍යම පරිසර අධිකාරිය යටතේ "පිළිසරු ව්‍යාපෘතිය" මඟින් ක්‍රියාත්මක වන ඝන අපද්‍රව්‍ය කළමනාකරණය මඟින් කාබනික පොහොර නිෂ්පාදනය කරන ආයතනවලින් ද තොරතුරු ලබා ගැනිණි. මාතර, බදුල්ල, කුරුණෑගල, රත්නපුරය, අනුරාධපුරය සහ ගම්පහ යන දිස්ත්‍රික්කයන් අධ්‍යයන ප්‍රදේශය ලෙස සලකන ලදී.

අධ්‍යයනයේ දී හෙළි වූ කරුණු අනුව, කාබනික පොහොර භාවිතා කිරීමට ගොවීන් තුළ වැඩි කැමැත්තක් පවතී. එසේ ම, කාබනික පොහොර භාවිතා කරන්නන්ගෙන් 94%ක් ම කාබනික පොහොර නිෂ්පාදනය සිදු කරනු ලබයි. තව ද, මෙම කාබනික පොහොර භාවිතා කරන්නන් ඒවා බහුලව ම යොදන්නේ එළවළු වගාවන් සඳහා ය. ඊට අමතර ව, තේ වගාව, පලතුරු හා බුලත් වගාවන් සඳහා භාවිතා කිරීම ද හඳුනාගත හැකි ය. නිෂ්පාදකයින් මෙන් ම භාවිතා කරන්නන්ගෙන් 98%ක් ම කාබනික පොහොර නිෂ්පාදන අවස්ථාවේ හෝ වගාව සඳහා භාවිතා කරන අවස්ථාවේ දී රසායනික පොහොර කළවම් කිරීම සිදු කරනු ලබන බව අනාවරණය විය.

කාබනික පොහොර නිෂ්පාදකයින්ගෙන් බහුතරයක් (35%) 36-45 අතර වයසේ පසුවන්නන් ලෙස හඳුනාගත හැකි ය. කාබනික පොහොර නිෂ්පාදනය කරන්නන්ගෙන් 71%ක් ම රජයේ අනුග්‍රහය ලැබුව ද 29%ක් තරම් ප්‍රමාණයක් කිසිදු අනුග්‍රහයක් නො ලබන්නෝ ය.

කාබනික පොහොර නිෂ්පාදනයේ දී නිෂ්පාදකයින් මුහුණ දෙන ගැටලු දෙස බැලූ විට 57%ක ගේ ම ප්‍රධාන ගැටලුව වන්නේ ශ්‍රමිකයන් සොයා ගැනීමේ ගැටලුව බව පෙනේ. ශ්‍රමිකයන් යොදා ගෙන කාබනික පොහොර නිෂ්පාදනය කරන නිෂ්පාදකයින් සංඛ්‍යාව 44%ක් ලෙස වාර්තා වේ. මෙයට අමතර ව, කාබනික පොහොර නිෂ්පාදකයින් මුහුණ දුන් ගැටලු ලෙස නිශ්චිත වෙළෙඳපොළක් නොමැතිවීම, ගබඩා පහසුකම් නොමැති වීම, කාබනික පොහොර ප්‍රවාහනය සඳහා අධික වියදමක් දැරීමට සිදුවීම, ඉඩකඩ ප්‍රමාණවත් නොවීම, අමුද්‍රව්‍ය සොයා ගැනීමට ඇති අපහසුව හා ඒ සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුවීම, උපකරණ ලබාගැනීමට

වියදම් දැරීමට සිදුවීම, තාක්ෂණික පුහුණුව නොමැතිවීම හා කාලගුණික වශයෙන් සිදුවන බාධාවන් ආදිය හඳුනා ගැනීමට හැකි විය.

කාබනික පොහොර නිෂ්පාදකයෙකු කාබනික පොහොර කිලෝ එකක් නිපදවීමට රු. 12.30 වැනි නිෂ්පාදන පිරිවැයක් (පවුලේ ශ්‍රමය සහිත ව) දරනු ලබයි. එසේ වුව ද, නගර සභා සහ ප්‍රාදේශීය සභා ආශ්‍රිත ව අපද්‍රව්‍ය කළමනාකරණය මඟින් නිපදවනු ලබන කාබනික පොහොර අලෙවි කරනු ලබන්නේ කිලෝ එකක් රු. 8-10 වැනි මුදලකට ය. මෙය කාබනික පොහොර නිෂ්පාදකයින්ට ගැටලුවක් වී තිබේ. එසේ ම, කාබනික පොහොර නිෂ්පාදකයන්ගේ පොහොර සඳහා ප්‍රමිති සහතිකයක් මෙතෙක් ලබා දී නොමැත. තව ද, කාබනික පොහොරවල ප්‍රමිතිය මෙන් ම යෙදිය යුතු ප්‍රමාණය හා අඩංගු විය යුතු සංඝටක පිළිබඳව ද නිශ්චිත අවබෝධයක් නොමැති වීම තවත් ගැටලුවකි.

රජය 2012 සිට පොහොර සහනාධාරයෙන් 25%ක් අඩු කිරීම ආරම්භ කරන ලදී. මෙයට විකල්පයක් ලෙස 25%ක් රසායනික පොහොර සහනාධාරය යටතේ ම කාබනික පොහොර ද ලබාදීමට පියවර ගැනීම කාබනික පොහොර ප්‍රචලිත වීමට මෙන් ම නිෂ්පාදනයට ද වැදගත් වේ. මේ සඳහා අවශ්‍ය පොහොර දැනට කාබනික පොහොර නිෂ්පාදනය කරන නිෂ්පාදකයින්ගෙන් ලබාගත හැකි වේ. එමෙන් ම, ඔවුනට අවශ්‍ය අමුද්‍රව්‍ය ද ගොම පොහොර, කුකුල් පොහොර, වියළි කලාපය තුළ ඇති ගවගාල් ආශ්‍රයෙන් ලබා දිය හැකි ය. කාබනික පොහොර නිෂ්පාදනය කර භාවිතා කරන ගොවීන් සඳහා කොහුබත්, ගොම යනාදිය වියළා ගඩොල් ආකාරයෙන් සකස් කොට ලබාදීම ද කළ හැකි ය.

එසේ ම, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කොට ඇති (Fertilizer Recommendations for Horticultural Crops, 2007) නම් වූ පොත සිංහලයට පරිවර්තනය කොට ගොවිජන සේවා මධ්‍යස්ථානවලට බෙදා දීම වැදගත් වේ. එම ග්‍රන්ථයෙ හි සෑම බෝගයක් සඳහා ම පොහොර යෙදිය යුතු ප්‍රමාණය පිළිබඳව සඳහන් වීම නිසා කාබනික පොහොර භාවිතා කරන්නන් සඳහා මෙය වැදගත් වේ. කාබනික පොහොර සහනාධාරයක් ඇති කිරීම තුළින් මෙම ප්‍රශ්නයට දිර්ඝකාලීන විසඳුමක් ලබාදිය හැකි ය.